# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/8 - 2016 ඔක්තෝබර් මස 03 වැනි සඳුදා - 2016.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නියෝගය මගින් මෙම පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2015.11.20 වැනි දිනැති අංක 1941/29 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනය I හි I වන තීරුවෙහි පහත සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව සඳහන් වූ සෑම භාණ්ඩයක් සඳහාම, ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම භාණ්ඩයක් මතම ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2016.10.04 දින සිට ගෙවිය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 03 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* I | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* II | *විස්තරය* III | *නිෂ්පාදන බද්ද* IV |
|---|---|---|---|
| **24.02** | | **දුම්කොළ වලින් හෝ දුම්කොළ ආදේශකවලින් නිෂ්පාදිත සුරුට්ටු, කට තබන පැත්ත උල්වූ සුරුට්ටු, සිගාරිලෝස් සහ සිගරැට්.** | |
| | | | |
| | 2402.20 | දුම්කොළ අඩංගු සිගරැට් : | |
| | 2402.20.20 | දිග මි.මී. 60 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු.11,675/- |
| | 2402.20.30 | දිග මි.මී. 60 ට වැඩි නමුත් දිග මි.මී. 67 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු.17,375/- |
| | 2402.20.40 | දිග මි.මී. 67 ට වැඩි නමුත් දිග මි.මී. 72 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු.20,500/- |
| | 2402.20.50 | දිග මි.මී. 72 ට වැඩි නමුත් දිග මි.මී. 84 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු.30,500/- |
| | 2402.20.60 | දිග මි.මී. 84 ට වැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු.34,250/- |

10 - 516

1A - PG 3154 — 557 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*